# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2298/32 - 2022 සැප්තැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 3/2013 (ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා
ගුවන් සේවා අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ දීය.

**නියෝග**

1\. (1) මේ නියෝග 2022 අංක 12 දරන වෙළඳ නැව් (සමුද්‍රීය සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා විශේෂිත පියවර) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ XI-I වන පරිච්ඡේදය, කලින් කලට සංශෝධිත පරිදි වන 1988 ප්‍රොටොකෝලය සහ එම ප්‍රොටොකෝලයට පසුව සිදු කරනු ලබන සංශෝධන බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.


1A - G 37567 - 08 (2022/09)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www. documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## I වන කොටස

### *මේ නියෝගවල අදාළත්වය*

2\. (1) මේ නියෝගයේ (2) වන අනු නියෝගයේ විධිවිධානවලට යටත්ව, මේ නියෝග, කවර හෝ තැනක තිබිය හැකි ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ගමන් කරන වෙනත් යම් විදේශීය නැව්වලට අදාළ විය යුතු ය.

(2) මේ නියෝග :

*(අ)* යුධ නැව් සහ හමුදා භට පිරිස් නැව්වලට ;

*(ආ)* යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය කරනු නොලබන නැව්වලට ;

*(ඇ)* පුරාතනයේ ඉදිකළ දැවමය නැව්වලට ;

*(ඈ)* වෙළඳාමේ නිරත නොවන විනෝද ගමන් යාත්‍රා ; සහ

*(ඉ)* ධීවර යාත්‍රා සඳහා,

අදාළ නොවිය යුතු ය.

## II වන කොටස

### *විශේෂ පියවර*

3\. අංක 2261/49 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ වන්නා වූ තොග බඩු රැගත් නැව් සහ තෙල් ටැංකර නැව්, සංවිධානය විසින් සම්මත කරන ලද සහ සංශෝධිත පරිදි, 2011 තොග බඩු රැගෙන් නැව් සහ තෙල් ටැංකර නැව් සමීක්ෂණ කිරීම් අතරතුර පරීක්ෂා කිරීමේ වැඩි දියුණු කළ වැඩසටහන පිළිබඳ ජාත්‍යන්තර සංග්‍රහයට අනුකූලව පරීක්ෂා කිරීමේ වැඩි දියුණු කළ වැඩසටහනකට යටත් විය යුතු ය.

4\. (1) දළ ටොන් බර සියය සහ ඊට වැඩි සියලු මගී නැව් සහ දළ ටොන් බර තුන්සිය සහ ඊට වැඩි සියලු භාණ්ඩ නැව් වෙත, සංවිධානය විසින් සම්මත කරන ලද IMO නැව් හඳුනාගැනීමේ අංක පටිපාටියට අනුකූලවන හඳුනාගැනීමේ අංකයක් ලබාදිය යුතු ය.

(2) (අ) නැවේ හඳුනාගැනීමේ අංකය, අංක 2261/49 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 වෙළෙඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාල වන නැව් සඳහා, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ I වන පරිච්ඡේදයේ 12 වන නියෝගය හෝ I වන පරිච්ඡේදයේ 13 වන නියෝගය යටතේ, මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1988 ප්‍රොටොකෝලය යටතේ, සම්මුතියේ IX වන පරිච්ඡේදයේ 4 වන නියෝගය යටතේ ISPS සංග්‍රහයේ A/19.2 වන හෝ A/19.4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකවලට සහ ඒවායෙහි සහතික කරන ලද පිටපත්වලට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

(3) නැවේ හඳුනාගැනීමේ අංකය -

(අ) නැවෙහි පශ්චාත් භාගයේ හෝ නැව් බඳේ එක් පැත්තක නැවේ දොරටුවෙහි සහ නැවේ දක්ෂිණභාගය අතරමැද, වෙන්කළ ගැඹුරකට පැටවුම් රේඛාවට ඉහළින් හෝ මතුපිට ආකෘතියේ එක් පැත්තක, දොරටුව සහ නැවේ දක්ෂිණභාගයේ හෝ මතුපිට ආකෘතියේ ඉදිරිපස පෙනෙන ස්ථානයක හෝ මගී නැව් සම්බන්ධයෙන් වන විට දී, ගුවනේ සිට බලන විට පෙනෙන තිරස් මතුපිටක ; සහ

(ආ) සම්මුතියේ II වන පරිච්ඡේදයේ 3.30 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි, යන්ත්‍ර සූත්‍ර අවකාශවල එක් කෙළවර තීරයක් බැඳ හිසක් මත හෝ නැව් තට්ටු දොරටුවක් මත හෝ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක හෝ ටැංකර නැව් සම්බන්ධයෙන් වන විට දී, පොම්පාගාරයේ හෝ රෝ - රෝ අවකාශයන් සහිත නැව් සම්බන්ධයෙන් වන විට දී, සම්මුතියේ II-2 වන පරිච්ඡේදයේ 3.41 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි, රෝ - රෝ අවකාශවල එක් කෙලවර තීරයක් බැඳ හිසක් මත,

ස්ථිරවම සලකුණු කරනු ලැබිය යුතු ය.

(4) ස්ථිර සලකුණු කිරීම, පැහැදිලිව පෙනෙන, නැව් බඳේ ඇති වෙනත් යම් සලකුණු අතරින් හොඳින් පෙනෙන පරිදි විය යුතු අතර, එය කැපී පෙනෙන වර්ණයකින් වර්ණ ගන්වනු ලැබිය යුතු ය.

(5) (අ) වන අනු-නියෝගයේ සඳහන් කරන ලද ස්ථිර සලකුණු කිරීම උසින් මි. මී. 200ට නොඅඩු විය යුතු ය. 3 (ආ) වන උප-නියෝගයේ සඳහන් කරන ලද ස්ථිර සලකුණු කිරීම උසින් මි. මී. 100ට නොඅඩු විය යුතු ය. සලකුණුවල පළල උසට සමානුපාතික විය යුතු ය.

(6) ස්ථිර සලකුණු කිරීම, ඉහළට මතු වූ අකුරුවලින් හෝ එය කැපීමෙන් හෝ මැද සිදුරු කිරීමෙන් හෝ පහසුවෙන් මකා දැමීමට නොහැකි වන නැවේ හඳුනාගැනීමේ අංකය සලකුණු කිරීමේ වෙනත් යම් සමාන ක්‍රමයකින් සලකුණු කරනු ලැබිය යුතු ය.

(7) වානේ හෝ ලෝහ නොවන ද්‍රව්‍යයකින් ඉදිකරන ලද නැව්වල, (මේ නියෝගවල "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළෙඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා, විසින්, නැවේ හඳුනාගැනීමේ අංකය සලකුණු කිරීමේ ක්‍රමය අනුමත කරනු ලැබිය යුතු ය.

(8) සියලු සැලසුම්, අත්පොත් සහ 2005 ජූලි මස 01 වැනි දින හෝ එදිනට පසුව ඉදිකරන ලද නැව්වල නෞකාස්ථව ගෙන යා යුතු විවිධ IMO සම්මුති මගින් නියම කරනු ලබන වෙනත් ලේඛනවල, නැවේ හඳුනාගැනීමේ අංකය පැහැදිලිව කියවා ගත හැකි සහ පහසුවෙන් තේරුම්ගත හැකි ආකාරයකින් සලකුණු කරනු ලැබිය යුතු ය.

5. (1) අංක 2261/49 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ වන්නා වූ නැවක සෑම සමාගමක් ම සහ ලියාපදිංචි අයිතිකරුවකු ම වෙත සංවිධානය විසින් සම්මත කරන ලද IMO අනන්‍ය සමාගම් සහ ලියාපදිංචි අයිතිකරුවන් හඳුනාගැනීමේ අංක පටිපාටියට අනුකූලවන හඳුනාගැනීමේ අංකයක් සපයනු ලැබිය යුතු ය.

(2) සමාගමේ හඳුනාගැනීමේ අංකය, සම්මුතියේ IX වන පරිච්ඡේදයේ 4 වන නියෝගය සහ ISPS සංග්‍රහයේ A/19.2 වන හෝ B/19.4 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකවලට සහ ඒවායෙහි සහතික කරන ලද පිටපත්වලට ඇතුළත් කරනු ලැබිය යුතු ය.

6. (1) අංක 2261/49 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ වන්නා වූ සෑම නැවකට ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සන්තතික සංක්ෂිප්ත වාර්තාවක් (Continuous Synopsis Record) තිබිය යුතු ය.

(2) (අ) සන්තතික සංක්ෂිප්ත වාර්තාව මගින්, එහි වාර්තා කර ඇති තොරතුරුවලට අදාළව නැවේ ඉතිහාසය පිළිබඳ නෞකාස්ථ වාර්තාවක් ලබාදිය යුතු ය.

(ආ) 2004 ජූලි මස 1 වැනි දිනට පෙර ඉදිකරන ලද නැව් සඳහා, සන්තතික සංක්ෂිප්ත වාර්තාව මගින්, අවම වශයෙන් 2004 ජූලි මස 01 වැනි දින සිට නැවේ ඉතිහාසය පිළිබඳ වාර්තාව ලබා දිය යුතු ය.

(3) (1) වන අනු-නියෝගයේ සඳහන් කරන ලද සන්තතික සංක්ෂිප්ත වාර්තාවෙහි, අවම වශයෙන්, පහත දැක්වෙන තොරතුරු අන්තර්ගත විය යුතු ය.

*(අ)* නැව විසින් ප්‍රදර්ශනය කිරීමට හිමිකම් කියනු ලබන ධජය අයත් රාජ්‍යයේ නම ;

*(ආ)* එම රාජ්‍යය සමග නැව ලියාපදිංචි වී ඇති දිනය ;

*(ඇ)* 5 වන නියෝගයට අනුකූලව නැවේ හඳුනාගැනීමේ අංකය ;

*(ඈ)* නැවේ නම ;

*(ඉ)* නැව ලියාපදිංචි වී ඇති වරාය ;

*(ඊ)* ලියාපදිංචි අයිතිකරුගේ නම සහ එම අයිතිකරුගේ ලියාපදිංචි ලිපිනය ;

*(උ)* ලියාපදිංචි අයිතිකරු හඳුනාගැනීමේ අංකය ;

*(ඌ)* අදාළ වන්නේ නම්, ආවරණ රහිත බෝට්ටු කුලියට ගන්නා තැනැත්තාගේ නම සහ එම බෝට්ටු කුලියට දෙන තැනැත්තාගේ ලියාපදිංචි ලිපිනය ;

*(එ)* සමාගමේ නම, එය විසින් සුරක්ෂිතතා කළමනාකරණ කටයුතු සිදු කරගෙන යන්නා වූ ස්ථානයෙහි ලියාපදිංචි ලිපිනය ;

*(ඒ)* සමාගමේ හඳුනාගැනීමේ අංකය ;

*(ඔ)* නැව වර්ගීකරණය කර ඇති සියලු වර්ගීකරණ සංගම්වල නම් ;

*(ඕ)* නැව මෙහෙයවන සමාගම වෙත, සම්මුතියේ IX වන පරිච්ඡේදයේ 1 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි ISM සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති අනුකූලතා ලේඛනය (හෝ අතුරු අනුකූලතා ලේඛනය) නිකුත්කර ඇති පරිපාලනයේ හෝ ගිවිසුම්ගත රාජ්‍යයේ හෝ පිළිගත් සංවිධානයේ නම සහ ලේඛනය නිකුත් කරනු ලැබූ පදනම මත විගණනය සිදු කර ඇති ආයතනය ලේඛනය නිකුත් කරන ආයතනය හැර වෙනත් ආයතනයක් වන්නේ නම් , එම ආයතනයේ නම ;

*(ක)* නැව වෙත, සම්මුතියේ IX වන පරිච්ඡේදයේ 1 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි ISM සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය (හෝ අතුරු සුරක්ෂිතතා කළමනාකරණ සහතිකය) නිකුත් කර ඇති පරිපාලනයේ හෝ ගිවිසුම්ගත රජයේ හෝ පිළිගත් සංවිධානයේ නම සහ සහතිකය නිකුත් කරනු ලැබූ පදනම මත විගණනය සිදු කර ඇති ආයතනය සහතිකය නිකුත් කරන ආයතනය හැර වෙනත් ආයතනයක් වන්නේ නම්, එම ආයතනයේ නම ;

*(ග)* නැව වෙත, සම්මුතියේ XI-2 වන පරිච්ඡේදයේ 1 වන නියෝගයේ අර්ථ දක්වා ඇති පරිදි ISPS "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති ජාත්‍යන්තර නැව් ආරක්ෂණ සහතිකය (හෝ අතුරු ජාත්‍යන්තර නැව් ආරක්ෂණ සහතිකය) නිකුත් කර ඇති පරිපාලනයේ හෝ ගිවිසුම්ගත රජයේ හෝ පිළිගත් ආරක්ෂණ සංවිධානයේ නම සහ සහතිකය නිකුත් කරනු ලැබූ පදනම මත සත්‍යායනය සිදු කර ඇති ආයතනය වන්නේ නම්, එම ආයතනයේ නම ; සහ

*(ච)* එම රාජ්‍යයේ නැව ලියාපදිංචි කිරීම නවතන ලද දිනය.

(4) 3 (ඇ) සිට 3 (ඕ) දක්වා වන අනු-නියෝගවල සඳහන් කරන ලද සටහන්වලට අදාළ යම් වෙනස් කිරීම්, එම වෙනස් කිරීම් පිළිබඳ ඉතිහාසය සමග යාවත්කාලීන කරන ලද සහ වර්තමාන තොරතුරු සැපයිය හැකි වන පරිදි, සන්තතික සංක්ෂිප්ත වාර්තාවෙහි වාර්තා කරනු ලැබිය යුතු ය.

(5) (4) වන අනු - නියෝගයේ සඳහන් කරන ලද සටහන්වලට අදාළ යම් වෙනස් කිරීම් සම්බන්ධයෙන් වන විට දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ප්‍රායෝගිකව හැකි තාක් ඉක්මනින්, නමුත් එම වෙනස් කිරීම් සිදු කරන ලද දින සිට මාස තුනක් ඉකුත් වීමට පෙර, ශ්‍රී ලංකා ධජය ප්‍රදර්ශනය කිරීමට හිමිකම් කියනු ලබන නැව් වෙත, සන්තතික සංක්ෂිප්ත වාර්තාවේ ප්‍රතිශෝධිත සහ යාවත්කාලීන කරන ලද අනුවාදයක් හෝ එහි උචිත සංශෝධනයන් නිකුත් කරනු ලැබිය යුතු ය.

(6) (4) වන අනු - නියෝගයේ සඳහන් කරන ලද සටහන්වලට අදාළ යම් වෙනස් කිරීම් සම්බන්ධයෙන් වන විට දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සන්තතික සංක්ෂිප්ත වාර්තාවේ ප්‍රතිශෝධිත සහ යාවත්කාලීන කරන ලද අනුවාදයක් නිකුත් කරන තෙක්, වෙනස් කිරීම් පිළිබඳ පිළිඹිබු කිරීම සඳහා සන්තතික සංක්ෂිප්ත වාර්තාව සංශෝධනය කරන ලෙසට නැව් සමාගම වෙත හෝ නැවේ අයිතිකරු වෙත බලය ලබා දී නියම කළ හැකි ය. එවැනි අවස්ථාවල දී, සන්තතික සංක්ෂිප්ත වාර්තාව සංශෝධනය කරනු ලැබීමෙන් පසුව සමාගම විසින්, ප්‍රමාදයකින් තොරව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඒ පිළිබඳ දැනුම් දෙනු ලැබිය යුතු ය.

(7) සන්තතික සංක්ෂිප්ත වාර්තාව ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.

(8) සන්තතික සංක්ෂිප්ත වාර්තාව සංවිධානය විසින් සකස් කරන ලද ආකෘතියකින් විය යුතු අතර සංවිධානය සකස් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව පවත්වාගෙන යා යුතු ය. සන්තතික සංක්ෂිප්ත වාර්තාවේ යම් කලින් සිදු කරන ලද සටහන් නවීකරණය කිරීම, ඉවත් කිරීම හෝ යම් ආකාරයකින් මකා දැමීම හෝ විකෘත කිරීම සිදු කරනු නොලැබිය යුතු ය.

(9) නැවක් වෙනත් රාජ්‍යයක ධජයක් වෙතට පවරනු ලබන හෝ නැව වෙනත් අයිතිකරුවකුට විකුණන (හෝ නැව වෙනත් ආවරණ රහිත බෝට්ටු කුලියට ගන්නා තැනැත්තෙකු විසින් පවරා ගනු ලබන) හෝ නැවේ මෙහෙයුම් පිළිබඳ වගකීම වෙනත් සමාගමක් විසින් භාරගනු ලබන කවර හෝ අවස්ථාවක දී, සන්තතික සංක්ෂිප්ත වාර්තාව නෞකාස්ථව තැබිය යුතු ය.

(10) නැවක් වෙනත් රාජ්‍යයක ධජයක් වෙතට පවරනු ලැබීමට නියමිත අවස්ථාවක දී, නැව තම අධිකරණ බලය යටතේ පැවති කාල සීමාව ආවරණය කරමින් සන්තතික සංක්ෂිප්ත වාර්තාවේ පිටපතක් එකී රාජ්‍යය වෙත භාර දීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හැකි වන පරිදි, සමාගම විසින් නැව පවරනු ලැබීමට නියමිත ධජය අයත් රාජ්‍යයේ නම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(11) නැවක්, ගිවිසුම්ගත රජයයක් වන රජයයක් අයත් රාජ්‍යයක ධජයක් වෙතට පවරනු ලබන අවස්ථාවක දී, මෙහි අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එම රාජ්‍යයේ රජය වෙත, එකී පැවරීම සිදු කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින්, වෙනත් රාජ්‍යයන් විසින් නැව වෙත කලින් නිකුත් කරන ලද යම් සන්තතික සංක්ෂිප්ත වාර්තා ද සමග නැව ශ්‍රී ලංකාවේ අධිකරණ බලය යටතේ පැවති කාල සීමාව ආවරණය කරමින් අදාළ සන්තතික සංක්ෂිප්ත වාර්තාවේ පිටපතක් භාර දෙනු ලැබිය යුතු ය.

(12) නැවක් ශ්‍රී ලංකාවේ ධජය වෙතට පවරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පෙර සන්තතික සංක්ෂිප්ත වාර්තා සන්තතික සංක්ෂිප්ත වාර්තාවට අනුබද්ධ කළ යුතු අතර මේ නියෝගය මගින් අදහස් කරන අඛණ්ඩ ඉතිහාස වාර්තා ලබා දීම සඳහා එය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නැව වෙත නිකුත් කරනු ලබයි.

(13) මුල් සන්තතික වාර්තාව, නැවේ ආයු කාලය පුරාවටම නැවේ නෞකාස්ථව තැබිය යුතු අතර සෑම විටක දී ම පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකි විය යුතු ය.

7. (1) අංක 2261/49 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග අදාළ වන්නා වූ සෑම නැවක් විසින් ම යෝග්‍ය පහසුවෙන් ගෙන යා හැකි වායුගෝල පරීක්ෂා කිරීමේ උපකරණයක් රැගෙන යා යුතු ය. අවම වශයෙන්, මෙම උපකරණවලට සංවෘත අවකාශවලට ඇතුළු වීමට පෙරාතුව එහි ඔක්සිජන්, ගිනි ගන්නා සුළු වායූන් හෝ වාෂ්ප, හයිඩ්‍රජන් සල්ෆයිඩ් සහ කාබන් මොනොක්සයිඩ් සාන්ද්‍රණ මැන ගැනීමේ හැකියාව තිබිය යුතු ය. වෙනත් නියමයන් යටතේ රැගෙන යනු ලබන උපකරණ විසින් මේ නියෝගය තෘප්ත කළ යුතු ය. එවැනි සියලු උපකරණ ක්‍රමාංකනය කිරීම සඳහා සුදුසු ක්‍රම සපයනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු - නියෝගයේ සඳහන් කරන ලද යෝග්‍ය පහසුවෙන් ගෙන යා හැකි වායුගෝල පරීක්ෂා කිරීමේ උපකරණයක් හෝ උපකරණ තෝරා ගැනීම, සංවිධානය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශවල යෝග්‍ය විධිවිධානයන් සමග අනුකූලව සිදු කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

*සාමාන්‍ය විධිවිධාන*

8. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නැවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම් එවැනි නැවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීම හේතුවෙන් හෝ මේ පනතේ විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි සම්මුතීන් සමග අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නැව සිදු කිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව, මිනිස් ජීවිතවලට බරපතල හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකි වන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නැව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

9. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගයේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සම්මුතියේ හෝ 1988 ප්‍රොටොකෝලයේ විධිවිධානයන්හි අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

10. මේ නියෝගවල -

"පරිපාලනය" යන්නෙන්, යාත්‍රාව විසින් ප්‍රදර්ශනය කිරීමට හිමිකම් කියනු ලබන ධජය අයත් රාජ්‍යයේ රජය අදහස් වේ ;

"තොග බඩු රැගත් නැව්" යන්නෙන්, සාමාන්‍යයෙන් තනි තට්ටුවක්, නැව් බඩු අවකාශවල ඉහළ පැත්තේ ටැංකි සහ ධාන්‍ය ඔරු ටැංකි සහිතව ඉදිකරන ලද සහ මූලික ලෙසම තොග වශයෙන් වියළි බඩු ගෙන යාමට අදහස් කරන නැව් අදහස් වන අතර ඊට යපස් රැගෙන යන නැව් සහ පොදු භාණ්ඩ රැගෙන යන නැව් වර්ග ඇතුළත් වේ ;

"සමාගම" යන්නෙන්, නැවේ අයිතිකරු හෝ අයිතිකරුගෙන් නැව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබුවා වූ ද, එසේ වගකීම පවරා ගැනීමෙන් පසුව ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ සංග්‍රහය මගින් පනවා ඇති සියලු කාර්යයන් සහ වගකීම් භාර ගැනීමට එකඟ වී ඇත්තා වූ ද, කළමනාකරුවකු හෝ ආවරණ රහිත බෝට්ටු කුලියට දෙන තැනැත්තෙකු හෝ වැනි වෙනත් යම් සංවිධානයක් හෝ තැනැත්තෙකු අදහස් වේ ;

"IMO" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ ;

"ISM" යන්නෙන්, සංවිධානය මගින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, A.741(18) වන යෝජනා සම්මතය මගින් සම්මත කරන ලද නැව්වල ආරක්ෂිත මෙහෙයවීම සඳහා සහ දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර සුරක්ෂිතතා කළමනාකරණ සංග්‍රහය අදහස් වේ ;

"ISPS සංග්‍රහය" යන්නෙන්, සංවිධානය මගින් සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි, 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියේ ගිවිසුම්ගත රජයයන්ගේ සමුළුවේ 2 වන යෝජනා සම්මතය මගින්, 2002 දෙසැම්බර් මස 12 වැනි දින සම්මත කරන ලද පරිදි "අ" කොටසින් එම කොටසේ විධිවිධාන අනිවාර්ය වශයෙන් සහ "ආ" කොටසින් (එම කොටසේ විධිවිධාන නිර්දේශාත්මක වශයෙන් සලකනු ලැබිය යුතු ය.) සමන්විත, නැව්වල ආරක්ෂාව සහ වරාය පහසුකම් සඳහා වන ජාත්‍යන්තර නැව් සහ වරාය පහසුකම් ආරක්ෂිත සංග්‍රහය අදහස් වේ ;

"සංවිධානය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ ;

EOG 09 - 0242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.